**පශ්චාත් අස්වැන්න පිළිබඳ තාක්ෂණ ආයතනය - 2012**

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2012 දෙසැම්බර් 31 දිනට පශ්චාත් අස්වැන්න පිළිබඳ තාක්ෂණ ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.

1.2.1 උසස් ගිණුම්කරණ පරිචයන්

සම්පූර්ණයෙන් ක්ෂය කර තිබුණු නමුත් සමාලෝචිත වර්ෂයේදී ප්‍රයෝජනයට ගෙන තිබුණු පිරිවැය රු.51,420,673 ක් වූ ස්ථාවර වත්කම් විෂයයන් 08 ක් ප්‍රත්‍යාගණනය කර එම වටිනාකම් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

1.2.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

උපචිත පදනම මත ගිණුම් තැබීම ආයතනයේ සාමාන්‍ය ගිණුම්කරණ ප්‍රතිපත්තිය වුවද, පුහුණු පාඨමාලා ආදායම්, නේවාසිකාගාර ගාස්තු ආදායම් හා උපදේශන සේවා ආදායම් යනාදිය මුදල් පදනම මත ගිණුම්ගතකර තිබුණි.

1.2.3 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයට අදාල ලැබියයුතු ශ්‍රවණාගාර ආදායම් රු.23,000 ක් හා නේවාසිකාගාර ආදායම වූ රු.5,450 ක් ගිණුම්වලින් අත්හැර තිබුණි.

(ආ) රසායනාගාර උපකරණ අළුත්වැඩියා කිරීමේ ගිවිසුම වෙනුවෙන් 2013 වර්ෂයට අදාලව සමාලෝචිත වර්ෂයේදී ගෙවන ලද රු.207,200 ක් ඉදිරියට කළ ගෙවීම් ලෙස නොදැක්වීම හේතුවෙන් ඉදිරියට කළ ගෙවීම් ගිණුම එම ප්‍රමාණයෙන් අඩුවෙන්ද, වාර්ෂික වියදම් එම ප්‍රමාණයෙන් වැඩියෙන්ද දක්වා තිබුණි.

(ඇ) ජාතික ආහාර ප්‍රවර්ධන මණ්ඩලය මගින් ඉදිකිරීමට අපේක්ෂිත සහල් පිටි නුඩ්ල්ස් කර්මාන්ත ශාලාව සඳහා හා පුද්ගලික සමාගමක සහල් සැකසුම් මධ්‍යස්ථානයක් සඳහා උපදේශන සේවා සැපයීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂය සඳහා ලැබිය යුතු, එකතුව වූ රු.24,230 ක් මූල්‍ය ප්‍රකාශනවලින් අත්හැර තිබීම මත උපදේශන සේවා ආදායම් ගිණුම හා ණයගැති ගිණුම එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ඈ) පර්යේෂණ ව්‍යාපෘති සඳහා මිලදී ගන්නා ලද රු.137,290 ක් වටිනා උපකරණ ප්‍රාග්ධනිත කර ස්ථාවර වත්කම් යටතේ දක්වා නොතිබුණු අතර, එම වත්කම් ප්‍රාග්ධනිත නොකිරීම මත වාර්ෂික ක්ෂය හා වර්ෂයේ ඌනතාවය රු.13,729 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඉ) බැංකු ප්‍රකාශන අනුව බැංකු හර බදු හා බැංකු ගාස්තු එකතුව රු.35,787 ක් වුවද මූල්‍ය ප්‍රකාශනවල රු.32,307 ක් ලෙස දක්වා තිබීම නිසා එම ගිණුම රු.3,480 ක් අඩුවෙන්ද, වාර්ෂික ඌනතාවය එම ප්‍රමාණයෙන් අඩුවෙන්ද දක්වා තිබුණි.

(ඊ) ආයතනය සතු ඉඩම සඳහා 2006 සිට 2011 වර්ෂය දක්වා ගෙවන ලද රු.161,007 ක් වූ වරිපනම් සමුච්චිත අරමුදලට ගැලපීම් නොකර වර්ෂයේ වියදමක් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(උ) ස්ථාවර වත්කම් යටතේ ගිණුම්ගත කළයුතු ඉදිරිපස තාප්පයේ ග්‍රිල් වැටක් සවි කිරීමට ගෙවා තිබුණු රු.116,990 ක් ගොඩනැගිලි හා වතු නඩත්තු වියදම් වශයෙන් පුනරාවර්තන වියදම් යටතේ ගිණුම් ගතකර තිබුණි.

(ඌ) සමාලෝචිත වර්ෂයේ සැප්තැම්බර් මස සිට දෙසැම්බර් මස දක්වා ආයතනයේ බැංකු ගිණුමට සෘජු ප්‍රේෂණ ලෙස බැර වී තිබුණු එකතුව රු.462,377 ක් වූ තැන්පතු 19 ක් හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

1.2.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්.

---------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) දැනට සේවයේ නියුතු නිලධාරීන්ට ලබාදී තිබුණු රු.211,479 ක ගමන් වියදම් අත්තිකාරම් නිරවුල් නොකර වර්ෂ 02 කට අධික කාලයක් ගත වී තිබුණද එකී මුදල් අදාල නිලධාරීන්ගෙන් අයකර ගැනීමට සමාලෝචිත වර්ෂයේදීද කටයුතු කර නොතිබුණි.

(ආ) 2000 ජුනි 30 දින වී අලෙවි මණ්ඩලයේ සියළු වත්කම් හා වගකීම් 2006 ඔක්තෝබර් මාසයේදී පශ්චාත් අස්වැන්න පිළිබඳ තාක්ෂණ ආයතනය වෙත නිත්‍යානුකූලව පවරා තිබුණු අතර, දීර්ඝ කාලයක් තිස්සේ පැවති රු.2,513,330 ක් වූ ලැබිය යුතු ගිණුම් ශේෂ 12 ක් ද රු.1,138,123 ක් වූ ගෙවිය යුතු ගිණුම් ශේෂ 11 ක් ද 2013 ජුනි 24 දින වන විටත් පියවීමට හෝ පොත් වලින් ලියා හැරීමට හෝ කටයුතු කර නොතිබුණි.

(ඈ) 2000 ජුනි 30 දිනෙන් පසුව ඇති වූ වර්ෂ 2 ට වැඩි වර්ෂ 10 ක කාලයක් දක්වා පැවති සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල පෙන්නුම් කෙරෙන රු.490,893 ක් වූ ලැබිය යුතු ගිණුම් ශේෂ 11 ක් අයකර ගැනීම සඳහා හා රු.488,890 ක් වූ ගෙවිය යුතු ගිණුම් ශේෂ 21 ක් පියවීම සඳහා ඵලදායි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ ක්‍රියාත්මක කළ සංවර්ධන ව්‍යාපෘති සඳහා දරන ලද වියදම් ඒ ඒ අවස්ථාවේදී ප්‍රතිපූර්ණය කර ගැනීමට කටයුතු නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසානයේදී කෘෂිකර්ම අමාත්‍යාංශයෙන් රු.61,123 ක් වූ මුදලක් අයවිය යුතු තිබුණි.

1.2.5 විගණනය සඳහා සාක්ෂි නොවීම

---------------------------------

මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු පහත සඳහන් ගිණුම් විෂයයන් ඒවා ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවිය.

| විෂයය | | වටිනාකම | ඉදිරිපත් නොවූ සාක්ෂි. |
|---|---|---|---|
| | | රු. | |
| (අ). | ස්ථාවර වත්කම් | 89,795,633 | ස්ථාවර වත්කම් ලේඛනය |
| (ආ). | ණයගැති පාලන ගිණුම | 1,367,330 | (i) ණයගැති ලේඛනය<br>(ii) ණයගැති ශේෂ තහවුරු කිරීම්. |
| (ඇ). | වෙනත් ණයහිමියන් | 328,295 | (i) ණයහිමි ලේඛනය<br>(ii) ණයහිමි ශේෂ තහවුරු කිරීම්. |
| (ඈ). | ප්‍රකාශන මුද්‍රණ වියදම් | 177,250 | (i) ප්‍රකාශන නිකුත් කිරීම පිළිබඳ උපලේඛන<br>(ii) අවසන් තොග පිළිබඳ උපලේඛනය |
| (ඉ). | පුස්තකාල පොත් | 295,361 | පරිග්‍රහන ලේඛනය |
| (ඊ). | ජංගම වගකීම් | | |
| | අත්තිකාරම් | 520,086 | විස්තරාත්මක උපලේඛනය |
| | ටෙන්ඩර් තැන්පතු ප්‍රධාන කාර්යාලය | | |
| | රඳවා ගැනීම් | 279,854 | |

1.2.6 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්.

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නිති, රීති හා රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම් |
|---|---|
| (අ). ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | |
| මු.රෙ. 104 | ආයතනයට අයත් වාහන 02 කට අවස්ථා 02 කදී අනතුරුවලට ලක්වීමෙන් රු.183,255 ක අලාභයක් සිදුවී තිබුණි. ඒ සම්බන්ධයෙන් මු.රෙ. ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (ආ). රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ | |
| 1992 අගෝස්තු 19 දිනැති අංක 26/92 හා 1994 අගෝස්තු 03 දිනැති අංක 26/92 (i) හා 2002 පෙබරවාරි 25 දිනැති අංක 2002/01 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ | ආයතනය සතු ධාවන තත්ත්වයේ පවතින සංචිත වාහන 07 ක රාජ්‍ය ලාංඡනය හෝ ආයතනයේ නම මුද්‍රණය කර නොතිබුණි. |
| (ඇ). භාණ්ඩාගාර චක්‍රලේඛ | |
| 2002 නොවැම්බර් 28 දිනැති අංක අයි.ඒ.අයි/2002/2 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය. | පරිගණක උපාංග හා මෘදුකාංග සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛනයක් නඩත්තු කළයුතු වුවද, ආයතනය සතු පිරිවැය රු.5,689,901 ක් වු පරිගණක හා උපාංග සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛණයක් නඩත්තු කර නොතිබුණි. |

1.2.7 ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

පහත සඳහන් පරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2011 පෙබරවාරි 09 දිනැති අංක 13/2008 (ii) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව නිල වාහන හිමිකම් ඇති නිලධාරීන් හට ලබාදී ඇති මාසික ඉන්ධන ලීටර් ප්‍රමාණය තුළ සිය රාජකාරි අවශ්‍යතා සපුරාගත යුතුය. අතිරේක ඉන්ධන ප්‍රතිපාදන අවශ්‍ය වන්නේ නම් ඒ සඳහා අමාත්‍යාංශ ලේකම්වරයාගේ අනුමැතිය ලබාගත යුතු වුවත් ආයතනයේ සභාපති, නියෝජ්‍ය සභාපති හා අධ්‍යක්ෂ විසින් ඉන්ධන සීමාව ඉක්මවා පිළිවලින් රු.106,751ක් රු.10,406 ක් හා රු.45,156 ක් වටිනා ඉන්ධන ලබාගෙන තිබුණත්, ඒ සඳහා අමාත්‍යාංශ ලේකම්වරයාගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි.

(ආ) ආයතනයේ සංයුක්ත සැලැස්ම ඇතුළු ආයතනයට අවශ්‍ය පරිපාලන හා මූල්‍ය රෙගුලාසි සකස් කිරීමට ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය වෙත ලබාදුන් රු.400,000 ක අත්තිකාරම් අදාල කාර්යය ඉටුකර නොතිබියදී අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය රහිතව වර්ෂයේ වියදමක් ලෙස ගිණුම්ගත කර තිබුණි.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුළ ආයතනයේ මෙහෙයුම් කටයුතුවලින් රු.4,893,838 ක ඌනතාවයක් ඇතිව තිබුණු අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.7,480,881 ක් වීමෙන් මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.2,587,043 ක වර්ධනයක් දක්නට ලැබුණි.

2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන වියදම් සඳහා මහා භාණ්ඩාගාරයෙන් ලබා දී තිබුණු රු.52,782,809 ක මුදලින් සහ ස්වයං උත්පාදිත රු.20,917,075ක ආදායමින් වර්ෂයේ වියදම් දැරීමෙන් පසු අතිරික්තය රු.7,258,200 ක් විය. ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ මහා භාණ්ඩාගාරයෙන් ලබා දී තිබුණු රු.63,340,951 ක මුදලින් හා ස්වයං උත්පාදිත රු.18,588,181 ක ආදායමින්, වියදම් දැරීමෙන් පසු අතිරික්තය රු.5,716,309 ක් විය. සමාලෝචිත වර්ෂයේ ආදායමට එරෙහිව ලියා හරින ලද ස්ථාවර වත්කම් සඳහා ක්ෂය ප්‍රතිපාදනය රු.8,939,932 ක්ද, පාරිතෝෂික ගෙවීම් සඳහා ප්‍රතිපාදනය රු.3,083,813 ක් ද, වූ එකතුව රු.12,023,745 ක් ගැලපීම සමාලෝචිත වර්ෂයේ ඌනතාවයට හේතු වී තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්ය සාධනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) එළවළු හා පළතුරු ප්‍රවාහනයේදී සිදුවන හානිය අවම කිරීම සඳහා ප්ලාස්ටික් ඇසුරුම් භාවිතය ප්‍රචලිත කිරීමේ වැඩසටහන යටතේ වසර 06 කට පෙර මිලදී ගත් රු. 2,056,023 ක් වටිනා වර්ග 04 කට අයත් ඇසුරුම් උපකරණ 5181 ක් 2013 අගෝස්තු මස අවසාන් වන විටත් බෙදා හැර නොතිබුණි.

(ආ) 2012 වර්ෂයේ සංවර්ධන ව්‍යාපෘති යටතේ ප්‍රතිලාභීන් සඳහා සියයට 50 ක ප්‍රතිලාභිදායකත්වය මත ලබාදීමට මිලදී ගන්නා ලද රු.437,500 ක් වටිනා ජංගම වෙළඳකුටි 7 ක් විගණිත දිනය වූ 2013 ජුනි 24 දින වන විටත් බෙදා නොහැර ගබඩාවේ ඉතිරිව තිබුණි.

(ඇ) එළවළු හා පළතුරු ප්‍රවාහනයේදී සිදුවන හානිය අවම කිරීම සඳහා ප්ලාස්ටික් ඇසුරුම් භාවිතය ප්‍රචලිත කිරීමේ වැඩසටහන යටතේ අමාත්‍යාංශයෙන් ලද ප්‍රතිපාදනවලින් මිලදී ගත් ප්ලාස්ටික් ඇසුරුම් අලෙවියෙන් ලැබෙන මුදල් රු.12,695,600 ක් එම වැඩසටහන ප්‍රචලිත කිරීම සඳහා භාවිත නොකර නිෂ්කාර්යව ආයතනයේ ගිණුම්වල රඳවා තබාගෙන තිබුණි.

(ඈ) "අපි වවමු රට නගමු "ජාතික මෙහෙයුම යටතේ සියයට 50 ක ප්‍රතිලාභී දායකත්වය මත උපකරණ ලබාදීමේ ව්‍යාපෘතිවලින් අයකර ගත් රු.2,442,895 ක් වූ ප්‍රතිලාභී දායකත්වය එම වැඩසටහන සඳහා හෝ නව ව්‍යාපෘතියක් ආරම්භ කිරීමට හෝ යොදානොගෙන ආයතනයේ රඳවාගෙන තිබුණි.

3.1.1 පර්යේෂණ කාර්යසාධනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පර්යේෂණ යෝජනා තාක්ෂණික ඇගයීමකට ලක් කිරීම, ක්‍රියාත්මක කිරීම සඳහා අනුමැතිය ලබාදීම, කාර්තුමය ප්‍රගතීන් විශ්ලේෂණය, ප්‍රගති සමාලෝචනය හා අවසන් වාර්තා ඇගයීමට ලක් කිරීම ශ්‍රී ලංකා කෘෂිකර්ම පර්යේෂණ ප්‍රතිපත්ති සභාව (CARP) විසින් විධිමත් ලෙස මෙහෙයවා ඇති බවට සනාථ කළහැකි සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) නවීන ශිල්ප ක්‍රම භාවිතය, වැඩි දියුණු කළ ශිල්ප ක්‍රම ඉලක්ක ගත කණ්ඩායම් අතර ප්‍රචලිත කිරීම, කාර්යක්ෂමව භාණ්ඩ ප්‍රවාහන ක්‍රම හා ඇසුරුම් තාක්ෂණයන් හඳුන්වා දීම ආයතනයේ ප්‍රධාන අරමුණු වුවද 2011 හා 2012 වර්ෂවල පර්යේෂණ මගින් රු.658,890 ක පිරිවැය යොදවා නිෂ්පාදනය කරන ලද යන්ත්‍ර හා නිෂ්පාදනයන් ක්ෂේත්‍රයේ ව්‍යාප්ත කිරීමට ඵලදායි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඇ) ආයතනය විසින් වර්ෂ කිහිපයක සිට විශාල පිරිවැයක් දරමින් පර්යේෂණ මගින් එළි දක්වනු ලබන යන්ත්‍රසූත්‍ර ආයතනයේ තොග ලේඛනවල සටහන් කිරීමට, පේටන්ට් බලපත්‍ර ලබාගෙන නිර්මාණ අයිතිය සුරක්ෂිත කිරීමට හා යන්ත්‍රයේ පැවැත්ම සනාථ කර ගැනීමට ක්‍රියාකර නොතිබුණි. පර්යේෂණ ප්‍රතිඵල වන යන්ත්‍රසූත්‍ර හෝ තාක්ෂණයන් වෙළඳපලට හඳුන්වාදීමට කටයුතු කර නොතිබුණු අතර 2002 වර්ෂයේ සිට ආයතනය විසින් නිෂ්පාදනය කරන ලද යන්ත්‍රසූත්‍ර 21 ක් පිරිවැය හඳුනාගැනීමකින් තොරව ආයතනයේ ගොඩගසා තිබුණි.

(ඈ) 2009/2010 වර්ෂවල ආයතනය විසින් සිදු කළ පර්යේෂණ මගින් සොයා ගන්නා ලද තාක්ෂණයන් ක්ෂේත්‍රයට ලබාදීම අරමුණු කරගෙන පර්යේෂණ එළිදැක්වීමේ සම්මන්ත්‍රණයක් (Research Symposium)2012 වර්ෂයේ පවත්වා තිබුණි. එම සම්මන්ත්‍රණය තුළින් පර්යේෂණ 23 ක් එළි දක්වා තිබුණත් ඉහත පර්යේෂණ ක්ෂේත්‍රයට හඳුන්වා දීමට 2013 ජූනි 21 දින වන විටත් ප්‍රමාණවත් පියවරක් ගෙන නොතිබුණි. ආයතනයේ ප්‍රධාන අරමුණක් වූ වැඩි දියුණු කළ ශිල්ප ක්‍රම ඉලක්ක ගත කණ්ඩායම් අතර ප්‍රචලිත කිරීම යන අරමුණට ළඟාවීමට ප්‍රමාණවත් ක්‍රියාමාර්ගද ගෙන නොතිබුණි.

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

---

බටඅත කෘෂි තාක්ෂණික උද්‍යානයේ 2010 ගොවි සතිය ප්‍රදර්ශනය සඳහා පැළ ප්‍රවාහනය කිරීම වෙනුවෙන් කෘෂිකර්ම අමාත්‍යාංශයට ලබාදුන් රු.15,000 ක් වටිනා මධ්‍යම ප්‍රමාණයේ ප්ලාස්ටික් ඇසුරුම් 50 වෙනුවෙන් මුදල් අයකර ගැනීමට හෝ ලබාදුන් ප්ලාස්ටික් ඇසුරුම් නැවත ලබා ගැනීමට ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

3.3 අවිධිමත් ගනුදෙනු

---

2000 ජූනි 30 දිනට පී අලෙවි මණ්ඩලයේ පැවති වත්කම් පශ්චාත් අස්වැන්න පිළිබඳ තාක්ෂණ ආයතනයට පැවරීමේදී අදාල ලේඛනවල හා මූල්‍ය ප්‍රකාශනවල පිරිවැය රු.11,450 ක් ලෙස දක්වා තිබුණු කුබෝටා අත්ට්‍රැක්ටරයක් භෞතිකව ආයතනය සතුව නොතිබුණි.

3.4 නිෂ්ක්‍රිය හා ඌන උපයෝජිත වත්කම්

---

ආයතනය සතුව පැවති වටිනාකම රු.942,907 ක් වූ වාහන 06 ක් අවුරුදු 03-10 අතර කාලපරාසයක සිට නිෂ්ක්‍රියව පැවතුණු නමුදු එම වාහන අපහරණය සඳහා ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

3.5 ආර්ථික නොවූ ගනුදෙනු

-------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ආයතනය සතු ඉඩම සඳහා ගෙවිය යුතු බදු මුදල් 2006 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා කාලයට අදාලව නොගෙවීම හේතුවෙන් ඒ වෙනුවෙන් පොලී ලෙස රු.53,985 ක් 2012 සැප්තැම්බර් 15 දින ගෙවා තිබුණි.

(ආ) පශ්චාත් අස්වැන්න පිළිබඳ තාක්ෂණ ආයතනයට අයත් ධාවනය කළ නොහැකි අපහරණ තත්ත්වයේ පවතින වාහන 04 ක් වෙනුවෙන් සමාලෝචිත වර්ෂය සඳහා රක්ෂණ වාරික හා ආදායම් බලපත්‍ර වෙනුවෙන් රු.47,262 ක් ගෙවා තිබුණි.

3.6 වෙනත් රාජ්‍ය ආයතන වෙත ලබාදුන් ආයතනයේ සම්පත්

----------------------------------------------------------

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.4 වගන්තියට පටහැනිව පශ්චාත් අස්වැන්න පිළිබඳ තාක්ෂණ ආයතනයේ නිලධාරීන් තිදෙනෙකු කෘෂිකර්ම අමාත්‍යාංශයේ අමාත්‍යවරයාගේ කාර්යාලයට අනුයුක්ත කර තිබුණි. මේ සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගෙන නොතිබුණු අතර එම නිලධාරීන් තිදෙනාට 2012 වර්ෂය සඳහා ආයතනය විසින් රු.772,846 ක් වැටුප් හා වේතන ගෙවා තිබුණි.

3.7 කාර්ය මණ්ඩල පරිපාලනය

------------------------------

2012 දෙසැම්බර් 31 දිනට කාර්ය මණ්ඩලය පහත පරිදි විය.

| | අනුමත | තථ්‍ය | පුරප්පාඩු |
|---|---|---|---|
| මාණ්ඩලික | 41 | 23 | 18 |
| මාණ්ඩලික නොවන | 51 | 24 | 27 |
| සුළු සේවක | 61 | 29 | 32 |
| | 153 | 76 | 77 |

දීර්ඝ කාලයක සිට පවතින පුරප්පාඩු සම්පූර්ණ කිරීමට කටයුතු කර නොතිබුණි.

3.8 වාහන උපයෝජනය

---------------------

ආයතනය සතු මෝටර් රථය 2011 අගෝස්තු 01 දින සිට තාවකාලිකව කෘෂිකර්ම අමාත්‍යාංශය වෙත අනුයුක්ත කර තිබුණු අතර ආයතනය විසින් 2012 වර්ෂයේදී රු.100,186 ක් වැය කර එම වාහනය අළුත්වැඩියා කර තිබුණි.

විගණිත දිනය වූ 2013 ජුනි 21 දින වන විටද අදාල වාහනය ආපසු ආයතනය වෙත ලබාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

3.9 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය

2012 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ මගින් හඳුනාගන්නා ලද ප්‍රතිසංස්කරණය කළ හැකි භාණ්ඩ අයිතම 41 ක්ද විකිණිය හැකි භාණ්ඩ අයිතම 21 ක්ද, විනාශ කළයුතු භාණ්ඩ අයිතම 270 ක්ද, වශයෙන් අයිතම 332 ක් සම්බන්ධයෙන් මු.රෙ.772 ප්‍රකාරව සුදුස්සක් කොට බැහැර කිරීමට කටයුතු කර නොතිබුණි.

4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

4.1 ක්‍රියාකාරී සැලැස්ම

වාර්ෂික ක්‍රියාකාරී සැලසුම ඉදිරිපත් කර තිබුණු නමුත් ක්‍රියාකාරී සැලැස්මේ භෞතික ඉලක්කයන් දක්වා නොතිබීම නිසා මූල්‍ය ඉලක්කයන් සපුරා ගැනීම්වලට අදාල භෞතික තථ්‍ය මට්ටම් කරා ලඟා වී තිබේ දැයි පරීක්ෂා කිරීමට නොහැකි විය. එසේම ක්‍රියාකාරී සැලැස්ම ඉටුකර ගැනීමේ ප්‍රගතිය කාලානුරූපව පරීක්ෂා කිරීම සඳහා ප්‍රමාණවත් ක්‍රමවේදයන් ආයතනය විසින් හඳුන්වා දී නොතිබුණි.

4.2 අභ්‍යන්තර විගණනය

ආයතනයේ විවිධ ක්ෂේත්‍ර ආවරණය කරමින් අභ්‍යන්තර විගණනය ක්‍රියාත්මක කර වාර්තා නිකුත් කර තිබුණද, එකී වාර්තා කිරීම් සම්බන්ධයෙන් කළමනාකරණය විසින් ප්‍රමාණවත් ක්‍රියාමාර්ගයන් ගෙන නොතිබීමෙන් අභ්‍යන්තර විගණනය සඵල පාලන උපක්‍රමයක් ලෙස භාවිතයට ගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

4.3 අයවැය ලේඛනමය පාලනය

(අ) අයවැයගත හා තථ්‍ය අගයන් අතර සියයට 28 සිට සියයට 267 දක්වා විචලනයන් නිරීක්ෂණය වුයෙන් අයවැය ලේඛනය, ප්‍රමාණවත් මූල්‍ය පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොතිබුණි.

(ආ) කිසියම් වැය විෂයයක් සඳහා තවත් වැය විෂයයක ඉතිරි වී ඇති ප්‍රතිපාදන මාරු කිරීම සඳහා අදාල අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගත යුතු වුවද, වැය විෂයයන් 14 ක් සඳහා නිසි අනුමැතියකින් තොරව ඉතිරි වූ වැය විෂයයන්වල ප්‍රතිපාදන මාරු කර ගැනීමෙන් 2012 වර්ෂයට අදාලව රු.6,390,118 ක් වියදම් ලෙස දරා තිබුණි.

4.4 වාර්ෂික වාර්තා සභාගත කිරීම

2008,2009 වර්ෂවලට අදාල වාර්ෂික වාර්තා 2012 ජුනි 07 දින පාර්ලිමේන්තුවේ සභාගත කර තිබුණු අතර 2010 වර්ෂයේ වාර්ෂික වාර්තාව සභාගත කිරීම සඳහා 2013 පෙබරවාරි 26 දින පාර්ලිමේන්තුව වෙත ලබා දී තිබුණි. 2011 වර්ෂයේ වාර්ෂික වාර්තාව ද සභාගත කිරීමට කටයුතු කර නොතිබුණි.

5. පද්ධති හා පාලනය

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර ආයතනයේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි අවධානය යොමු කළ යුතුව ඇත.

(අ) ස්ථාවර වත්කම් පාලනය

(ආ) ගිණුම්කරණය

(ඇ) සේවක මණ්ඩල පාලනය

(ඈ) අයවැය පාලනය

(ඉ) පර්යේෂණ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම

(ඊ) වාහන පාලනය